# රහස්

# දූපතේ

# නිධානය







J.A. ලවනත්‍යා තිලකරත්න

# රහස් දූපතේ නිධානය

# රහස් දූපතේ නිධානය

J.A. ලවන්‍යා තිලකරත්න
කතෘ

පළමු දිගහැරීම

පළමු දිගහැරීම

# පිදුම

හෙට ලොව දිනන්නට
වෙර දරණ
මා හට දැනුම දිරිය දුන්
මා පිය ගුරුවරුන්
වෙත සෙනෙහසින්
පිරිනමමි.

# පෙරවදන



**පෙරවදන**

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

## 01. පරණ පෙට්ටිය

ගමේ කෙළවර තිබුණු පරණ වලව්ව කාටත් බය හිතෙන තැනක් .එහා මෙහා යන අය කියන්නේ රෑට එතනින් අමුතු සද්ද ඇහෙනවාකියලා.6 වසරේ ඉගෙන ගන්න නුවන්ටයි සඳුනිගේ ඉතින් ඔය කතා වැඩක් නෑ. දෙන්නම හිටියේ අළුත් දේවල් හොය හොයා.

එක සෙනසුරාදා දවසක , පාසල් නිවාඩු දවසක දෙන්නා තීරණය කළා වලව්වේ රහස මොකද්ද කියලා හොයන්න.

ජනෙල්වලින් රිංගලා
බිඳුණු ජනෙල්වලින්
රිංගලා ඇතුළට ගියාම
දැක්කේ මකුළු දැල් ,
දුවිලි පිරුණු පුටු මේස
විතරයි. හදිස්සියේම
සඳුනිගේ කකුලේ පොඩි
පෙට්ටියක් හැප්පුණා.
“නුවන් මේක බලන්න! ”.
පෙට්ටිය ඇතුලේ තිබුණේ
කහ පාට වුණු පරණ
සිතියමක්.උඩින්ම
ලොකුවට රහස් දූපත
කියල ලියලා තිබුණා.



## 02. ගමන පටන් ගනී.

සිතියම අතට ගත්ත වෙලේ
ඉදන් නුවන්ට නින්ද ගියේ
නැහැ.
"සඳුනි, අපි මේක
හොයන්නම ඕනි.හිතන්නකෝ
අපිට රත්තරන් හම්බවුනොත්
ගමට ඉස්කෝලයක් හදන්න
පුළුවන්. එතකොට ගමේ
හැම ළමයටම ඉස්කෝලේ
යන්න පුළුවන් වේවී."සඳුනි
ටිකක් බය වුණා."එත් නුවන් ,
අත්තම්මා කියලා තියනවා,ඒ
දූපතේ යකෙක් ඉන්නවා
කියලා.අනික අපිට
බෝට්ටුවකුත් නෑනේ.

එත් නුවන් අතහැරියේ නම් නැහැ.පසුවදා උදේම ගඟ ළඟට ගියා.මාමාගේ පරණ බෝට්ටුවක් වැස්සට තෙමී තෙමී තිබුණා.සඳුනි ඒ අතරේ බෑගයට වතුර බෝතල් දෙකකුත් බිස්කට් පැකට් එකකුත් දාගත්තා.තව හඳුන්කූරුෑයි ගිනි පෙට්ටියකුයි දා ගත්තා. ඒ හුළං හමන දිශාව සොයා ගන්න.

මුලින්ම මුහුද හරිම සන්සුන් .නිල්පාට වතුරේ ඉර එළිය වැටිලා දිලිසෙනවා.මාළු ඒ මේ අත පීනනවා.සඳුනි සිතියම දිග හැර බැලුවා.

"නුවන් මෙතන තියනවා හිරු බසින දිශාවට පැය 2යි කියලා. ඒ කියන්නේ බටහිර දිශාවට .පැයක් විතර යද්දී එක පාරටම අහස කළු වුණා.සුළඟ හැමූ වේගයට සඳුනිගේ අතින් සිතියම පාවෙලා ගියා. වාසනාවට නුවන්ගේ අතේ තිබුණු හබලේ එය රැදුණා. තප්පර ගාණෙන් මුහුද රකුසෙක් වගේ වුණා.රළ,කදු වගේ උඩට යනවා. බෝට්ටුව එහාට මෙහාට විසි වෙනවා. පැය ගානකට පස්සේ ඈතින් කළු පාට ගල් කන්දක් පෙණුනා. ඒක තමයි ඒ දූපත.යාළුවෝ දෙන්නා සතුටින් කෑ ගැසුවා. අපි ආවා. අපි ඇත්තටම ආවා. දෙන්නම එකවර කිවුවා.

## 03. නිහඬ දූපතේ හඬ

දූපත මැරුණු තැනක් වගේ.ගහක් කොලක් නෑ. තියෙන්නේ කළු ගල් විතරමයි. අමුතු පාලු තැනක්.ටික දුරක් යද්දී කළු ගලක මොනවාදෝ ලියලා තිබුණා. නුවන් මේ බලන්නකෝ මේ අකුරු අපේ ඉතිහාසය පොතේ තිබුණ ගල් යුගයේ අකුරු වගේ.

සඳුනි ඒ ගල අත ගාලා බැලුවා. එක පාරටම අමුතු එළියක් දකුණු පසින් ආවා. මේ දෙන්නා ඒ පැත්තට ගියා.එක පරණ මේසයක් උඩ පහන් තුනක් පත්තු කරලා තිබුණා. හරියටම සිතියමේ තිබුණු විදිහටම. ඒත් බිම එක පහනක් පත්තු කරලා තිබුනේ නැහැ. අපි දෙන්නා අතේ ගිනි පෙට්ටියක් තිබුණ නිසා ඒ පහන පත්තු කළා.

ගුහාවම එළිය වුණා.එතන තිබුණු මේසයයි පහන් ටිකයි එකපාරටම එහාට වෙලා එතන පඩිපෙළක් මතු වුණා." මෙතන තමා නිධානය හංගලා ඇත්තේ ." නුවන් පඩිපෙළ දෙස බලාගෙන කීවා.

## 04. නිධානය සොයා ගනී.

පඩිපෙළෙන් දෙන්නා ම බැස්සා.එතන තිබුණේ ගල් කාමරයක් .ඒ කාමරය මැද ලී පෙට්ටියක් තිබුණා.එකට යකඩ අගුලක් දාලා තිබුණා.ඒක මලකඩ කාලා තිබුණ නිසා ඒක කඩන්න අමාරු වුණේ නැහැ.නුවන් අගුලට ගැහුවා විතරයි අගුල කඩාගෙන බිමට වැටුණා.

නොහිතපු විදිහට එකේ තිබුණේ පරණ පොත් තුනකුයි ලිවුමකුයි පොඩි ඇට ටිකකුයි. සඳුනි පොතක් අරගෙන එකේ තිබුණ දූවිලි ටික පිඹලා පොත පෙරළුවා. එකේ තිබුණේ ලංකාවේ දුර්ලභ බෙහෙත් පැළෑටි හා ඒවා භාවිතය ගැන තොරතුරු.පැරණි ගොවිතැන් ක්‍රම වගේ දේවල්. මේවා අපේ ගමේ අයට ගොඩක් ප්‍රයෝජනවත් වෙයි.

## 05. අවසන් පණිවිඩය

සඳුනි ලිවුම දිග හැරලා බැලුවා.එකේ තිබුණේ,

ධෛර්යවන්ත දරුවනි,

ඔයාලාමේ නිධානය හොයා ගත්තා. ඔයාලා මං හිතාගෙන හිටියට වඩා බුද්ධිමත්. අපේ මුතුන් මිත්තන්ගේ දැනුම රත්තරන්වලට වඩා වටිනවා. මේ බෙහෙත් ඇට පැළ කරන්න.ලෙඩ වුණ දුප්පත් අයට උදව් කරන්න.

මීට, මුතු වෙද සීයා.

අපිට රත්තරන්වලට වඩා වටින දෙයක් ලැබුණේ. නුවන් එක කිව්වේ පොත් ටික බදා ගනිමින්.



## 06. ගමනේ අවසානය

මෙයාලට හම්බුන බඩු බෑගයකට දා ගත් සදුනි නුවන් එක්ක එළියට එනකොට "සදුනිටයි,නුවන්ට" කියලා බෝට්ටුවක් තිබුණා. මෙයාලා එකට නැගලා ගමට ගියේ බිස්කට් පැකට් එක කන ගමන්. බෝට්ටුවෙන් එනකොටම අපේ ළමයි එනවා කියලා කෑ ගැසුවේ සදුනිගේ අම්මා. අපි හිතුවේ ඔයාලා මුහුදට බිලි වුණා කියලා. නුවන්ගේ තාත්තා කිවේ වේවලමින්. මෙයාලා එයාලට හමුවුණ දේවල් ගැන කීවා. ගමේ වෙද මහත්තයා ඇවිත් පොත ටික අතට ගත්තා. එයාගේ ඇස් උඩ ගියා ඒවා දැකලා. දෙයියනේ මේ අපේ පැරැන්නෝ පාවිච්චි කළ සීතාවක වෙද පොත නේද සැබෑ ගමන ආරම්භ වූයේ දැන් දෙන්නාටම හිතුනා.

## 05. අළුත් ආරම්භය

ගෙදර ආවට පස්සේ නුවනුයි, සඳුනුයි වැඩේට බැස්සා,සියාගේ උදව්වෙන් ගෙවත්තේ පැළ තවානක් හැදුවා. දූපතෙන් ගෙනාපු බෙහෙත් ඇට ටික පැළ කරා. පොත් තුනම හොදට කියවලා පැළවලට ලෙඩ හැදුනම දාන්න බෙහෙත් හදන හැටි ඉගෙන ගත්තා.

ටික දවසකින් අම්මා කෙනෙක් දුවගෙන ආවා.අනේ පුතේ මගේ පු තාට හෙදෙටම උණ. බෙහෙත් ගන්න සල්ලි නෑ. සදුනි හිනාවෙලා අළුත් පැළයක කොළ ටික කඩලා තැම්බුවා.



සියාගේ පොතේ තියෙන පරණ
බෙහෙත්. පුදුමයකට වගේ පොඩි
ළමයට පැය කිහිපයකින් සුව
වුණා.එදා ඉදන් ගමේ කට්ටිය
එන්නේ නුවන්ලගේ ගෙදරට.
සල්ලිවලට නෙවේ.නොමිලේ.පාසලේ
විදුහල්පතිතුමා දෙන්නාට
සම්මානයකුත් දුන්නා. ගමේ පොඩි
දොස්තරලා කියලා. රෑට සියා
ගහක් යටට වෙලා පොත් කියලා
දෙනකොට නුවන් සදුනිගෙන්
ඇහුවා සදුනි අපිට රත්තරන් හම්බ
වුණේ නැති එක හොදයි නේද
කියලා ඔව් නුවන් රත්තරන්
තිබ්බනම් අපි දෙන්නා විතරයි
පොහොසත් .දැන්මුළු ගමම
පොහොසත්.අන්තිමට දෙන්නා
සිතියම පිච්චුවා.මොකද රහස්
දූපතේ කතාව එයාලගේ හිතේ
තියෙන නිසා.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සව්බළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මුලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN 978-624-211-346-3